Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**දෙවන වාර ඇගයීම - 2018**
**,உணஷலஹகஷ ஜடஇண கஜபகஷகப்ல்**
**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: **සිංහල භාෂාව හා සාහිත්‍යය** | පත්‍රය / வினாத்தாள் / Paper: I /II | පැය / மணித்தியாலம் / Hours: 02 |

නම
நகஅஉஷ ----------------------------------------
Name

සැලකිය යුතුයි.

- පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. I සහ II පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.

## I **කොටස**

- පහත වාක්‍යවල ඉරි ඇඳි කොටසට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සමහර බස් රථ <u>ඉබි ගමනින්</u> ගමන් කිරීම නිසා මගීන්ට නියමිත වේලාවට රැකියාවලට යාමට නොහැකි වෙයි.
(1) නොසැලකිල්ලෙන් (2) ඉතා හෙමින් (3) නවත්වමින් (4) ඉතා වේගයෙන්

(02) නරක මිතුරන් සමග කිසිම <u>ඇයි හොඳයියක්</u> පැවැත්විය යුතු නැතැ'යි තාත්තා අපට කීවේ ය.
(1) සුහදතාවක් (2) සම්බන්ධයක් (3) තරහක් (4) විරුද්ධත්වයක්

(03) අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ඓතිහාසික - ග්‍රන්ථාරූඪ (2) පුරාවිද්‍යාඥ - ලාංචනය
(3) තාක්ෂණය - ප්‍රතිශක්තිකරණ (4) සංවර්දනය - කෞතුකාගාරය

- මුලින් දී ඇති පදයට සමාන අර්ථය **නොදෙන** පදය තෝරන්න.

(04) සාගරය - (1) සිඳු (2) සයුර (3) මුහුද (4) නදිය

- මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය තෝරන්න.

(05) අවබෝධ - (1) පළිබෝධ (2) අනවබෝධ (3) සුබෝධ (4) ආබාධ

(06) ''ලෙඩ කපුටෝ වැල කනවා වාගෙයි. යන ප්‍රස්තාව පිරුළට වඩාත් සමීප අර්ථය වන්නේ,
(1) ඉතා ඉක්මනින් වැඩක් කිරීම (2) නුසුදුසු වැඩක් කිරීම
(3) ඕනැවට එපාවට යම් වැඩක් කිරීම (4) අකැමැත්තෙන් යම් වැඩක් කිරීම

- ප්‍රශ්න අංක 7-8, වාක්‍යාංශ වෙනුවට යෙදිය හැකි තනි පදය තෝරන්න.

(07) යමෙකු හෝ යමක් සිහිපත් කිරීම.
(1) ස්මරණය (2) අනුස්මරණය (3) මතකය (4) සිහිකැඳවීම

(08) ''කළ ගුණ නොසලකන''
(1) අකෘතඥ (2) අපායගාමී (3) කෘතඥ (4) අකාරුණික

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(09) අභිමානය යන පදය අයත් වන්නේ,
(1) නාම විශේෂණ පදවලට යි (2) ක්‍රියා විශේෂණ පදවලට යි
(3) අනවසාන ක්‍රියා පදවලට යි (4) උපසර්ග පදවලට යි

(10) ''ඔවුහු'' යන පදය අයත් වන්නේ,
(1) උත්තම පුරුෂ ඒක වචනයට යි. (2) මධ්‍යම පුරුෂ බහු වචනයට යි.
(3) ප්‍රථම පුරුෂ බහු වචනයට යි. (4) මධ්‍යම පුරුෂ ඒක වචනයට යි.

- එක් එක් වාක්‍යයේ ඉරි ඇඳි ක්‍රියා පද වර්ගය අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(11) ☼ කුරුල්ලෝ ආහාර <u>සොයමින්</u> පියාඹති.
☼ මුද්දරය <u>ඇලවා</u> ලියුම තැපැල් කළ යුතු ය.
☼ අම්මා බත් <u>පිසුවා ය</u>.
(1) අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (4) මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා

(12) නිවැරදි ව පද වෙන් කර ලියා ඇති වාක්‍යය වන්නේ,
(1) ගස් වලින් පිරි සිදු වාතාශ්‍රය ලබමු (2) නිව හල් දේශය ක් ගොඩ නගමු
(3) ශිල්පී හු තම වැඩකටයුතු වල නියැලෙති (4) ජාතියේ අභිමානය සුරකිමු

(13) ☼ ඉනිබ්බෙ ☼ උරණව ☼ ආචාරි භාග ☼ නිග්‍රහ
ඉහත සඳහන් පදවල අරුත් පැහැදිලි කළ විට නිවැරදි පිළිවෙළ වන්නේ,
(1) ඊට පසුව, කෝප වී, ගුරු පඬුරු, අවමාන (2) කෝප වී, ඊට පසුව, අවමාන, ගුරු පඬුරු
(3) ගුරු පඬුරු, අවමාන, කෝප වී, ඊට පසුව (4) ඊට පසුව, කෝප වී, අවමානය, ගුරු පඬුරු

(14) දිය බිඳුවක <u>ගැලී ගැලී</u>
ඉහත කාව්‍ය පාදයේ ඉරි ඇඳි කොටසේ කාව්‍ය උපක්‍රමය වන්නේ,
(1) එළිසමය යි (2) උපමාවකි (3) රූපකයකි (4) අනුප්‍රාසය යි

(15) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මහතාගේ කාව්‍ය නිර්මාණ නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) වැස්ස, සිනා කුමාරි, වෙසක් මිහිර (2) වෙසක් මිහිර, ඇත්ගාලේ දරු පෙම, මගේ රට
(3) රාත්‍රිය, සේපාලිකා, මගේ රට (4) මගේ රට, වැස්ස, සිනා කුමාරි

(16) .............................. හොඳින් ඉගෙන රටේ සංවර්ධනයට උර දෙමු.
(1) ඔහු (2) මම (3) නුඹ (4) අපි

(17) .............................. ඉතා මිහිරි ලෙස ගීයක් ගායනා කළා ය.
(1) දැරියක් (2) දැරියක (3) දැරියකු (4) දැරියන්

(18) වෛද්‍යවරු .................... සුවපත් කරති.
(1) රෝගියෝ (2) රෝගීන් (3) රෝගීහු (4) රෝගියෙක්

(19) අතීතයේ රජවරු දැහැමෙන් සෙමෙන් රට පාලනය ..................
(1) කළෝ ය (2) කළේ ය (3) කළෙමි (4) කළෙහු

(20) තාරකා පෙළ අහසේ අලංකාර ව ........................
(1) බබළයි (2) බබළති (3) බබළන්නෝ ය (4) බැබළුනහ

(ලකුණු 2x20=40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

1 හා 2 ප්‍රශ්න අනිවාර්යය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තවත් තුනක් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

(01) ඔබ පන්තියේ කරන ලද නිවේදන වැඩ සටහන ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. ඔබ කණ්ඩායම ඉදිරිපත් කළේ කුමක් සම්බන්ධ නිවේදනයක් ද? (ලකුණු 01)
ii. නිවේදනය සකස් කිරීමේ දී ගුරුවරයා ඔබට දුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)
iii. නිවේදනය ඉදිරිපත් කිරීමේ දී ඔබ සැලකිල්ලට ගත් කරුණු 03 ක් ලියන්න. (ලකුණු 03)
iv. නිවේදන වැඩ සටහන ඉදිරිපත් කිරීමෙන් පසු ව ඔබ ලැබූ කුසලතා 2ක් ලියන්න. (ලකුණු 02)
v. ඔබේ පාසලේ පැවැත්වීමට නියමිත චිත්‍ර ප්‍රදර්ශනය පැවැත්වෙන දිනය දැනුම් දීමට නිවේදනයක් සකස් කර ලියන්න. (ලකුණු 04)
vi. ඔබට පාසලේ දී අසන්නට ලැබුණු නිවේදන මාතෘකා 04 ක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

(02) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා වචන 150 ක රචනාවක් ලියන්න.

1. වැඩිහිටියන් රැක බලා ගනිමු
2. පොදු දේපළ සුරකිමු
3. සඳපහන් රැය
4. අධ්‍යාපනය සාර්ථක ජීවිතයකට මං සලසයි
5. මම ගං වතුරකට මැදි වීමි

(ලකුණු 14)

(03) ඔබ පාසලේ ක්‍රීඩා සංගමයේ ලේකම් යයි සිතා ඔබේ පාසලේ පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උළෙලට සහභාගි වන ලෙස දන්වමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

නැතහොත්

7 ශ්‍රේණියේ ශිෂ්‍යයෝ ග්‍රහලෝකාගාරය නැරඹීමට යාමට අදහස් කරති. ඒ සඳහා දිනයක් වෙන් කර ගැනීමට ග්‍රහලෝකාගාරයේ අධ්‍යක්ෂතුමාට ලියන ලිපිය සකස් කරන්න. ඔබ චාරිකා සංගමයේ ලේකම් යයි සිතන්න.

(ලකුණු 10)

(04) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1961 මැයි මස 08 වන දින කල්කටාවේ ජොරාශංකර් භාවන් හි දී උපන් තාගෝර් බිළිඳා මහා ඍෂි දේවෙන්ද්‍ර නාත් තාගෝර් සහ ශිදො දෙවි නම් වූ දෙමාපියන් දෙදෙනාගේ දාහතරවෙනි දරුවා විය. මෙම දරුවා කුඩා කළ පටන් ම සංගීතයට ඇලුම් කර ඇත.

රබින්ද්‍රනාත් තාගෝර්තුමා ලේඛකයෙකු, චිත්‍ර ශිල්පියෙකු, සංගීතඥයෙකු ද ගායකයෙකු ලෙස ද ලෝක ප්‍රසිද්ධ විය. රබින්ද්‍ර සංගීතය නමින් ඔහුගේ ගායනා ශෛලිය ප්‍රකට ව ඇත. භක්ති ගීත ප්‍රබන්ධ කොට ඒවා ගායනය කොට ඇත. එතුමා විසින් ප්‍රබන්ධ කර ගැයූ ගීත සියල්ල එක් කර ''ගීතාංජලී'' නම් ග්‍රන්ථය සකස් කොට ඇත. 1913 දී එම ග්‍රන්ථයට නොබෙල් ත්‍යාගය හිමි ව ඇත. එම ත්‍යාගය ලබා ගත් ප්‍රථම ඉන්දියානු ජාතිකයා වීමේ භාග්‍යය ද එතුමාට ලැබී ඇත.

තාගෝර්තුමා අධ්‍යාපනඥයෙක් ද දේශපාලඥයෙක්ද විය. අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය වන ලෙසත් චරිත සංවර්ධනයත් හික්මුණු බවත් අධ්‍යාපනය තුළින් එතුමා බලාපොරොත්තු වූ බැව් පෙනී යයි. එතුමාගේ ශ්‍රේෂ්ඨ චරිතය දෙස බැලීමේ දී පෙනෙන විශේෂ ලක්ෂණය වනුයේ මිනිසෙකු තුළ පවතින ශක්තීන් අප්‍රමාණ බවත්, ඒවා එකින් එක තම ජීවිතය තුළින් අවදි කොට ගෙන ඇති අකාරයත් ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

1. රබින්ද්‍රනාත් තාගෝර්තුමාගේ දෙමාපියන්ගේ නම් ලියන්න.
2. රබින්ද්‍රනාත් තාගෝර්තුමා ලෝක ප්‍රසිද්ධියට පත් වූ ක්ෂේත්‍ර දෙකක් ලියන්න.
3. එතුමා විසින් රචිත ග්‍රන්ථයක් ඇගයීමට පත් වූ බව ප්‍රකාශ කෙරෙන වාක්‍යය, ඡේදයෙන් උපුටා ලියන්න.
4. එතුමාගේ චරිතයෙන් අපට ලබා ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.
5. පරසිදු , එකිනෙක යන වචනවලට සමාන තේරුම් දෙන වචන දෙක ඡේදයෙන් උපුටා ලියන්න.

(ලකුණු 2×5 =10)

(05) ''රාජ කුමාරවරුන් නම් කල් යවා ශිල්ප උගන්නට බැරිය, වහා ශිල්ප උගත මැනවැ''

i. මෙම ප්‍රකාශය කවුරුන් විසින් කියන ලද්දක් ද?
ii. කා හට කියන ලද්දක් ද?
iii. මෙම කොටස ඇතුළත් පාඩමේ නම කුමක් ද?
iv. මෙම පාඩම උපුටා ගත් මුල් කෘතියේ නම ලියන්න.
v. එය අයත් වන්නේ කවර යුගයට ද?

(ලකුණු 2x5=10)

(06) සිලිලාරෙක හෙල් මැලී

පෙති අතරින් සැලි සැලී

---------------------------------------

---------------------------------------

i. මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
ii. මෙම කවිය උපුටා ගත් පාඩම කුමක් ද?
iii. මෙම පද්‍ය නිර්මාණය කළ කවියා කවරෙක් ද?
iv. මෙම පද්‍ය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?
v. ''සිලිලාර'' යන්නෙහි තේරුම ලියන්න.

(07) පහත දැක්වෙන කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මිනිසා නගන කටහඬ නොම වැකෙන කනේ
ඇත මේ කුරුලු කූඩුව උස ගසක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගේ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇති මුත් සිය කැදැල්ලෙ හි
පැටවා කැමති නැත හිර වී විසිල්ලෙ හි
දෙනෙතට නිල් අහස යොමුවන ඇසිල්ලෙ හි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙ හි

i. මේ කවිවලින් කියවෙන්නේ කවුරුන් ගැන ද?
ii. කුරුලු කූඩුව ඇත්තේ කුමන ස්ථානයක ද?
iii. කුරුලු පැටියාගේ ඇස් ඇරී ඇති බව හඟවන කවි පදය උපුටා ලියන්න.
iv. කුරුලු පැටියාට නිල් අහස පෙනෙන විට ඔහු සොයන්නේ කුමක් ද?
v. මෙම කවිවල ඇති නාම විශේෂණ පද දෙකක් ලියන්න.

(ලකුණු 2x5=10)